මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.12. 23

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED 03/2024

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**<u>රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2024 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම</u>**

**01. ප්‍රසාද දීමනා ගෙවීම**

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2024 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම පහත පරිදි සිදු කළ යුතුය.

| අංකය | ආයතනික වර්ගීකරණය | යෝජිත ප්‍රසාද දීමනාව |
|---|---|---|
| 1. | **I.** 2023 මූල්‍ය වර්ෂය තුළ ලාභ උපයා, බදු පසු ලාභයෙන් අවම වශයෙන් 30% ක් ඒකාබද්ධ අරමුදලට ලාභාංශ/ අයබදු ලෙස ගෙවා ඇති හා,<br>**II.** අමාත්‍ය මණ්ඩලය හෝ මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද දිරි දීමනා ක්‍රමයක් හැර **පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් ආකාරයක දිරි ගැන්වීමක් මත පදනම් වූ දිරි දීමනාවක්** <u>නොගෙවනු ලබන</u> කිසියම් රාජ්‍ය සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සහ රජය සතු සමාගමක්. | රු.25,000/- |

| | | |
|---|---|---|
| 2. | **I.** 2023 මූල්‍ය වර්ෂය තුළ ලාභ උපයා, බදු පසු ලාභයෙන් අවම වශයෙන් 30% ක් ඒකාබද්ධ අරමුදලට ලාභාංශ/ අයබදු ලෙස ගෙවා ඇති හා,<br>**II.** අමාත්‍ය මණ්ඩලය හෝ මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද දිරි දීමනා ක්‍රමයක්, හැර **පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් ආකාරයක දිරි ගැන්වීමක් මත පදනම් වූ දිරි දීමනාවක්** <u>ගෙවන</u> කිසියම් රාජ්‍ය සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සහ රජය සතු සමාගමක්. | රු.20,000/- |
| 3. | 2023 මූල්‍ය වර්ෂය තුළ ලාභ උපයා ඇති නමුත් බදු පසු ලාභයෙන් අවම වශයෙන් 30% ක් ඒකාබද්ධ අරමුදලට ලාභාංශ/ අයබදු ලෙස ගෙවා නොමැති හෝ 2023 මූල්‍ය වර්ෂය තුළ අලාභ ලබා ඇති රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් ලාභදායීත්වය මත පදනම්ව කාර්ය මණ්ඩලය වෙත ප්‍රසාද දීමනා ගෙවීම සඳහා <u>**හිමිකම් නොලබයි**</u>. | |

**02. අනුගමනය කළ යුතු පිළිවෙළ**

2.1. ප්‍රසාද දීමනාවක් ලෙස සැලකිය හැකි මධ්‍ය කාලීන දීමනාවක් කිසියම් ආයතනයක් විසින් තම කාර්ය මණ්ඩලයට ගෙවා ඇති විට, එම දීමනාව අතිරේක ප්‍රසාද දීමනාවක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩලය අනුමැතියක් ඇත්නම් මිස එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවෙහි අත්තිකාරමක් ලෙස සැලකිය යුතුය.

2.2. වාර්ෂික ප්‍රසාද දීමනාව ගෙවීමට පෙර මෙම චක්‍රලේඛ උපදෙස් පරිදි එම ප්‍රසාද දීමනා ගණනය කිරීම නිවැරදිව සිදු කර තිබේද යන්න තහවුරුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. මෙසේ ප්‍රසාද දීමනා ගෙවීමට පෙර සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සහ පාරිතෝෂික වැනි සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා ප්‍රතිපාදන සැපයීම සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල වගකීම විය යුතුය.

2.3. මෙම යෝජිත ප්‍රසාද දීමනාව සේවකයන්ට ගෙවීම තුළින් කිසියම් ආයතනයක ඉදිරි ආයෝජන කටයුතු සඳහා හෝ අනෙකුත් ආයතනික කටයුතු සඳහා අහිතකර මූල්‍යමය බලපෑමක් ඇතිවන බවට හඳුනා ගතහොත්, එවැනි අවස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි මෙම යෝජිත ප්‍රසාද දීමනාව වඩා අඩු අගයක් සඳහා සංශෝධනය කළ හැක.

2.4. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 (ii) 05 වන වගන්තියට අනුකූලව 2023.12.31 වන විට පාලිත සමාගම් විසින් තම පරිපාලිත සමාගම් සඳහා පරිපාලිත ප්‍රතිපත්තිය හඳුන්වා දී නොමැත්තේ නම් එම පරිපාලිත සමාගම් සඳහාද මෙම චක්‍රලේඛය වලංගු කර ගත යුතු වේ.

2.5. 2023 වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ප්‍රසාද දීමනා ගෙවීම් සිදු කළ යුතුය.

**03. විශේෂ කරුණු**

3.1. ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අරමුදල් මහා භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

3.2. සාමූහික ගිවිසුම් හෝ වෙනත් එවැනි අවබෝධතා ගිවිසුම් යටතේ වැටුප් සහ අනෙකුත් දීමනා ගෙවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ නොවේ.

3.3. රජය සතු ව්‍යවසායන්හි කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වුවහොත්, අමාත්‍ය මණ්ඩලයේ විශේෂ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ.

**04. පැහැදිලි කර ගැනීම්**

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (011-2484617) අමතන ලෙස කාරුණිකව දන්වමි.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව